දුරකථන
தொலைபேசி
Telephones } 011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary } 011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax } 011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail } info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website } www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය
எனது இல.
My No. } PSC/EST/02-08/05/20

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2024.03. 14

---

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>ලිඛිත විභාගයක ප්‍රතිඵල මත පමණක් පදනම්ව සිදු කෙරෙන බඳවා ගැනීම්වලදී ප්‍රසිද්ධ කරන ලද පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි ගණනක් සම ලකුණු ලබාගත් අපේක්ෂකයින් සිටින අවස්ථාවලදී තෝරාගැනීමක් සිදු කිරීම සඳහා අනුගමනය කළ යුතු පටිපාටිය</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 92 අනුව බඳවාගැනීමක් සඳහා වූ තෝරාගැනීමේ ක්‍රියාවලියේදී, සම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සංඛ්‍යාව පිරවීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩිවන අවස්ථාවක, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අභිනියෝජිත පත්කිරීම් බලය දරන අදාළ බලධරයා විසින් ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වාර්තා කර උපදෙස් ලබාගත යුතු වේ.

2. ලිඛිත විභාගයක ප්‍රතිඵල මත පමණක් පදනම්ව සිදු කෙරෙන බඳවා ගැනීමකදී ඉහත තත්වය ඇතිවන අවස්ථාවක, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වැඩිදුර තෝරාගැනීමක් සිදු කරනු ලැබීම සඳහා ඉඩ සැලසෙන පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අභිනියෝජිත පත්කිරීම් බලය දරන බලධරයින් විසින් එවැනි බඳවාගැනීම් සඳහා වූ අයදුම්පත් කැඳවීමේ නිවේදන වල පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කළ යුතු වේ.

*"කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පුරවාගෙන යාමේදී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබා ගත් සුදුසුකම්ලත් අපේක්ෂකයින් සිටී නම් හා එම පුරප්පාඩු ද පිරවීමේ සේවා අවශ්‍යතාවක් තත්කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයින් අතුරින් වැඩිදුර තෝරාගැනීමක් සිදුකිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. මෙම තෝරාගැනීමේ පටිපාටිය පහත පරිදි කොටස් දෙකකින් යුක්තය.*

*I. අපේක්ෂකයින්ගේ හැකියාව ඇගයීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය*
*II. කුසලතා පාදක සම්මුඛ පරීක්ෂණය*

*ලිඛිත පරීක්ෂණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පැවැත්වෙනු ඇත.*

*සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ.*

*මෙම තෝරාගැනීමේ පටිපාටියේ ව්‍යුහය හා අන්තර්ගතය පිළිබඳ වැඩිදුර තොරතුරු <u>www.psc.gov.lk</u> හි රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ පහත වෙබ් පිටුවේ පළ කර ඇත.*

*මුල් පිටුව ⟶ බාගත කිරීම ⟶ ක්‍රියා පටිපාටි ⟶ විශේෂ තෝරාගැනීමේ පටිපාටිය"*

3. ලිඛිත විභාගයක ප්‍රතිඵල පදනම්ව පමණක් බඳවාගැනීම සිදු කරනු ලබන, රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්කිරීම් බලධරයා වන සේවා/සේවා ගණ/තනතුරු සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදන කෙටුම්පත් කිරීමේදී ද අදාළ පරිපාලන බලධරයින් විසින් ඉහත වගන්තිය එම නිවේදනවල ඇතුළත් කළ යුතුය.

ඩබ්ලිව්. එච්. එම්. එම් සී. කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව